# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/153/2019 (NPC)**

ඩබ්.එස්.ටී.බණ්ඩාර
**අභියාචක**

**එදිරිව,**
පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2025.09.30**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

මෙම අභියාචනය 2025.05.08 වන දින කැඳවූ අවස්ථාවේදී අභියාචක විසින් දන්වා සිටියේ, ඔහුගේ එකම ඉල්ලීම වන්නේ ඔහුව විශ්‍රාම ගැන්වීමට කටයුතු සලසා දෙන ලෙසයි. එම ඉල්ලීම සළකා බලා, මෙම විනිශ්චය අධිකාරය වෙත ඔහු විසින් 2019.07.20 දිනැතිව ඉදිරිපත් කර ඇති අභියාචනය මඟින් ඉල්ලා ඇති, ඔහුව සේවයෙන් පහ කරමින් කර ඇති නියෝගය ඉවත් කිරීමට කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමු.

විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා අභියාචක විසින් කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් ඉදිරිපත් වන කරුණු මීළඟට සළකා බලමු. ඔහු විසින් මෙම අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති 2025.09.12 දිනැති ලිපියක සඳහන් කර ඇත්තේ, ඔහු 2010 වර්ෂයේ රාජකාරියේ නියුතුව සිටින අවස්ථාවේදී සිදු වූ රිය අනතුරක් හේතුවෙන් ඔහුගේ දකුණු දණහිස ශල්‍යකර්මයකට භාජනය කළ බවයි. එම කරුණ සනාථ කිරීම සඳහා ඔහු විසින් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එය 2010.06.28 දිනැතිව, නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අත්සනින් යුක්තව නිකුත් කර ඇත. එම

ශල්‍යකර්මය හේතුවෙන් ඔහුව සැහැල්ලු රාජකාරියේ නියුක්ත කරන ලෙසට ද දැනුම් දී ඇත. ඔහු සඳහන් කර ඇති පරිදි, 2010 වසරේ කරන ලද ශල්‍යකර්මයෙන් අනතුරුව, 2012 වසරේ ඇති වූ සිද්ධියක් මත ඉදිරිපත් කරන ලද චෝදනාවකට, අභියාචක වරදකරු බවට පත් කිරීම හේතුවෙන් ඔහුව සේවයෙන් පහ කර ඇත.

එම අවස්ථාව වන විට අභියාචක විසින් අවුරුදු 23කුත් මාස 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. ඉහත කී සිදුවීමට පෙර ඔහු විසින් කරන ලද සේවා කාලය තුළ කිසිදු විනය විරෝධී ක්‍රියාවක් නොකළ බවද, කිසිඳු දඬුවමකට යටත් නොවූ බවටද, සඳහන් කරමින් ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇත. ඊට අමතරව මඩකලපුව මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති 2007.09.11 දිනැති ලිපියක සඳහන් කර ඇත්තේ, මෙම අභියාචක මඩකලපුව කොට්ඨාශයේ රාජකාරියෙහි නියුතුව සිටි කාලය තුළ අවුරුදු 9ක කාලයක් මෙහෙයුම් කලාප තුළ ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිට ඇති බවයි. තවද, නැගෙනහිර දිශාව භාර නියෝජ්‍ය පොලිස්පතිගේ, 2005.02.02 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත ප්‍රශංසාවක්ද පිරිනමා ඇත. එය එලෙස ලබා දී ඇත්තේ, 2004.12.26 දින පැවති සුනාමි ඛේදවාචකය හේතුවෙන් ඔහු සේවය කළ පොලිස් ස්ථානය, ප්‍රචණ්ඩ මුහුදු ජලයෙන් යට වූ බිහිසුණු අවස්ථාවේදී, දෙපාර්තමේන්තුව සතු දේපල බේරා ගැනීම සඳහා වන ඔහු සතු වගකීම මැනවින් ඉටු කරමින් පොලිස් දෙපාර්තමේන්තුවේ ගෞරවය සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම හේතුවෙනි. තවද, අභියාචක විසින් දන්වා සිටින්නේ ඔහුගේ දරුවන් දෙදෙනාම උසස් අධ්‍යාපනය කටයුතුවල නිරත වී සිටින බවයි. ඒ හැරුණු විට බිරිඳ හෝ රැකියාවක් නොකරන බවත්, වෙනත් කිසිඳු ආදායමක්ද නොලබන බවත් ඔහු පවසා සිටී.

ඉහත කරුණු සලකා බලා අභියාචක සේවයෙන් පහ කිරීමේ විනය නියෝගය වෙනුවට ආයතන සංග්‍රහයේ II වන කොටසේ XLVIII වන පරිච්ඡේදයේ 24:8 ඡේදයේ සඳහන් කරුණු සළකා බලා, ඒ අනුව කටයුතු කරමින්, සානුකම්පිත විකල්පයක් ලෙස අභියාචක අනිවාර්යය විශ්‍රාම ගැන්වීම සඳහා නියෝගයක් නිකුත් කරමු.

ඉහත නියෝගය අනුව අභියාචකගේ සේවය අත්හිටවූ දින සිට ක්‍රියාත්මකවන පරිදි අභියාචක විශ්‍රාම ගැන්වීමට සහ ඔහුගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අභියාචකට අයිතිවාසිකම ඇත.

මෙම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි පියවර ගැනීමට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දන්වමින්, ඒ අනුව කටයුතු කරන ලෙස තවදුරටත් නියෝග කරමු.

ඉහත කරුණු හා කොන්දේසිවලට යටත්ව, අභියාචකගේ ඉල්ලීමට අවසර දෙමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-